# බොහීමියානුවෙක් ,ඇත්ත කවියෙක් සහ සොඳුරු ගායකයෙක් ඇවිත් ගියෝය

නිර්වර්ණ COLOURLESS
උපේක්ෂා සේනානායක

මාර්තු මාසෙ විසිවක් වෙනිදා පාන්දර පරිගණක තිරය මත අකුරු අමුණන්න සුන්දර නිමිත්තක් ඊයේ රාත්‍රියේදී රිචර්ගම් ප්‍රසාංගික කලා මධ්‍යස්ථානයේදී මට හමුවුණි. මෑත කාලයේ වඩාත් කථාබහට ලක්වූ සංගීතඥයා වන නදීක ගුරුගේත් මානවහිතවාදී සැබෑ කවියා රත්න ශ්‍රී විජේසිංහත් සරල සුන්දර ශාස්ත්‍රීය ගායකයා බණ්ඩාර අතාවුදත් එක්ව පැවැත්වූ සංගීත සැන්දෑව ඉතිරි කළ මිහිරි මතකය මේ ලිපිය ලියන්නට මා පෙළඹවූ ඒ නිමිත්ත වන්නේය. බැලූ බැල්මට එකිනෙක මුසු නොවන සංගීත ශෛලීන් දෙකක අත්හදා බැලීම් කරමින් යම් ගමනක යෙදෙන නදීක සහ බණ්ඩාරගේ සුසංයෝගය සමගින් රත්න ශ්‍රී ගේ රසාලිප්ත කෙටි දෙසුම් ප්‍රේක්ෂකාගාරය වින්දනයෙන් සහ ඥානයෙන් කිසියම් තලයකට ගෙන යෑමට සමත් වූ බව මගේ විශ්වාස-යයි.

මම රත්න ශ්‍රී ව ඉතා සමීපව ඇසුරු කරන්නියක නොවෙමි. එහෙත් දශක කිහිපයකට පෙර පාසල් නේවාසිකාගාරයෙන් ඉවත්ව ගාල්ලේ පෞද්ගලික නවාතැනකට යන යොවුන් සිසුවාගේ ප්‍රේමණීය මතකය ස්මරණය කරමින් සංවේදී ආරම්භයක් සටහන් කරමින් ප්‍රසංගයට ප්‍රවිශ්ඨ වූ අපේ කවියා සමස්ථ ප්‍රසංගය පුරාම යොවුන් තරුණයකු ලෙස සැහැල්ලුවෙන් එහෙත් අර්ථාන්විත ලෙස පූරකයෙකුගේ කාර්යයභාරය ඉටු කරනු මම දුටිමි. ද්වජ භංගය වැලඳුණු යකඩ කට වරින් වර බාධා පැමිණුවද කවියා සෑම ගීතයකම පසුබිම පිළිබඳව සැකෙවින් සහ ප්‍රේක්ෂකයා සෑහීමට පත්වන තරමින් හඳුන්වා දීමක් කළේය. ඔක්කම්පිටිය දුෂ්කර ගම්මානයේ වැවේ එරී මියගිය අහිංසක පාසල් සිසුවිය පිළිබඳ සිය පෞද්ගලික අත්දැකීම ඇසුරෙන් සුදු නෙළුම කෝ සොර බොර වැවේ ගීතයේත් නිකිණි වැස්ස චිත්‍රපටයේ තේමා ගීතයේත් පිටුපසින් දිවෙන ශ්‍රී ලාංකික ගැමි සමාජයේ විසඳුම් නොලත් සදාතනික ගැටළු පිළිබඳව මෙල්බර්න්



වාසීන් තුළ කම්පනයක් ඇතිකිරීමට ඔහුගේ නිරවුල් හඬට හැකි වුණ බව මට තදින්ම විශ්වාසය.ඔහු සත්තකින්ම ඇත්ත කවියෙකි.

නදීක ගුරුගේ යනු වෙනස් ආකාරයේ "වෙනසක" සංගීත කලාව තුල සිදු කළ හිතුවක්කාර නිර්මාණකරුවෙකි. ඔහු බොහීමියානුවෙකු වන්නේ එතැනදීය. ඔහු පළමුව ඔහුගේ නිර්මාණය රසවිඳින්නේය. ඇතැම් ගීත බණ්ඩ ගායනය කිරීමට පෙර ඔහු ඒ බව නොවලහා කීවේය. රස්තියාදුකාරයා ටෙලිනාට්‍යයේ නදීකගේ සංගීත සංයෝජනය අපට පවසන වැදගත්ම කරුණ වන්නේ නිර්මාණයක ගුණය මැනෙන එකම කාරණය එකී නිර්මාණයේ අනර්ඝත්වය විනා එය නිර්මාණය කිරීමට වැය කළ කාලය නොවන බවය. නදීක සංගීතය අනුභව නොකරන්නෙකි. මන්දයත් සංගීතය වනාහී ඔහුට පීරණය වූ විෂයයක් වන බැවිනි. ඔහු ශ්‍රී ලාංකිකත්වය ජාත්‍යන්තරයට ගෙනයෑමට වඩා ජාත්‍යන්තරය ශ්‍රී ලංකාවට ගෙන ආ උඩුගං බලා පිහිනන්නෙකි. එබැවින් ඔහුගේ හිතුවක්කාරකමට මම කැමැත්තෙමි. ප්‍රසංගය අවසානයේ නදීක ඉදිරිපත් කළ මංජුල වෙඩිවර්ධන විසින් රචිත "ඉලක්කය ගෙන හඳට වෙඩි තබන්න" යන ගීතය මුළු මහත් ප්‍රසංගයේ උත්කර්ෂවත් සහ ඉසියුම්ම අවස්ථාව යැයි මට දැනුණි.

නදීක සහ රත්න ශ්‍රී මෙන් සංවාදශීලී නොවූ අපේ ගායකයා බණ්ඩාර අතාවුද අඩ සියවසක් තුළ ගායනා කර තිබුණේ ගීත හැටක් වැනි සුළු ප්‍රමාණයක් වුවද ලාංකීය ගීත සාහිත්‍ය තුල ගායකයකු ලෙස ඔහු ගොඩනගා ගත් පෞරුෂය මෙල්බර්න් වෙ-දිකාව තුළ ඉහළින් සම්භාවනාවට පාත්‍ර වූ බව සිය ගායනය අවසානයේ සජීවීව ඔහු අත්දකිනු ප්‍රේක්ෂකාගාරයේ සිට මම බලා සිටියෙමි.

සොඳුරු සෙවණැලි සොඳුරු මතකයක් වී අප හිත් තුල පවතින්නේ ඒ සොඳුරු මිනිසුන්ගේ අව්‍යාජ නිර්මාණ භාවිතාව නිසාය. අපට අවශ්‍ය වන්නේ එවන් ඇත්ත කළා කරුවන් විනා බඩගෝස්තරවාදී නිර්මාණ මුදලාලිලා නොවන බව නිර්වර්ණ පළමු පියවරෙන් සිහිපත් කරන්නට කැමැත්තෙමි. ඒ ඇත්ත කවියාටත් බොහීමියා-නුවාටත් (ගල්මංකඩ රාළහාමි) සොඳුරු ගායකයාටත් මෙල්බර්න් ප්‍රජාවේ ප්‍රණාමය.

# ඉතිහාසයේ දිනක මෙසේ සිදුවිය





වර්ගවාදය හෝ ආගමික අන්තවාදය ලොව කොතැනක ඉස්මතු වුවද දෙවරක් නොසිතා එරෙහි විය යුතුය. ජන මනස ගිනිලන ධනපති ප්‍රයෝගයක් වූ මෙකී කරුණු දෙක තුලින් , ලෝකයේ පැවැත්මට එල්ල කල මිලේච්ච මාරක බාධකය ගණනය කල නොහැකි තරම් විනාශකාරීය.

රුවන්ඩාව යනු නැගෙනහිර අප්‍රිකානු කලාපය තුල දිගු කාලයක සිට වර්ගවාදයෙන් පෝෂණය වූ පසුගාමී සමාජයකින් පිරී ගිය රටකි. 1994 අප්‍රෙල් 7 වන දා සිට ජුලි මස අගභාගය දක්වා වූ කාලය තුල සිදු වූ වාර්ගික සමුලඝාතනය යනු ලෝක ඉතිහාසය කිරි ගැසුණු මිලේච්ච සිදුවීම් සමුදායකි. මහා ලේ ගංගාවකින් අප්‍රිකානු බිම තෙත් කල මේ ගැටුම දියත් වුයේ හුටු ගෝත්‍රිකයින් හා ටුට්සි ගෝත්‍රික ජනයා අතරය. රුවන්ඩා වේ බලය හෙබවූ හුටු ගෝත්‍රික ජනයාගෙන් සැදුම් ලත් රජය පෙරලා දැමූ ටුට්සි ගෝත්‍රික ජනයා ගේ Rwandan Patriotic Front විසින් සමුලඝාතනය ආරම්භ කළේය.

දීර්ඝ කාලයක් තිස්සේ පැවති සිවිල් යුද්ධය හේතුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයට සාම සාධක හමුදාවක් පවා එවීමට සිදු විය. එහෙත් මේ අති බිහිසුණු සමුලඝාතනය සිදු වීමත් සමගම එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවට එරට පුරවැසියන්ගේ ජීවිත ආරක්ෂා කිරීම වෙනුවට ප්‍රංශ ජාතිකයින් ඇතුළු සුදු හම ඇති යුරෝපීයන් පමණක් රැකගෙන රටින් පලා ගියේය.

එරට පුරවැසියන් එකිනෙකා මහා මග තිරිසන් සතුන් සේ මරා දමන විට ඔවුන්ගේ රැකවරණයට කිසිවෙකු නොසිටියේය. තෙමසක පමණ කාලයක සිදු වූ මේ ගැටුමෙන් අවම වශයෙන් මිනිසුන් මිලියනයක් මරා දැමීය.

පසු කලෙක නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටි ජාත්‍යන්තර යුධ අපරාධ විමර්ශන අධිකරණයෙන් දෙපාර්ශවයටම දඬුවම් පමුනුවන ලදී. සොහොන් බිමක් නොමැතිව රට පුරා පොළොවට පස් වූ මිනිස් ජීවිත අතරින් කිහිප දෙනෙකුට හෝ මේ ඡායාරූපයේ දිස්වෙන සොහොන් බිම ඉතිරි විය.

වර්ගවාදය අවුළුවා ලීමට ගතවන්නේ දේශප්‍රේමයෙන් ඔද්දල්වූ වචන මාත්‍රා කිහිපයක් පමණි. දිවට කටට නොදැනෙන ලෙස මුදා හරින එම වාග් ප්‍රහාරයෙන් බුර බුරා නැගෙන ගිනි දැල්ල නිවා දැමීමට හැකිවන්නේ කාටද ? ඉන් මිය යන්නේද පීඩාවට පත්වන්නේද කුඩා දරුවන් කාන්තාවන් ඇතුළු කුහුඹුවෙකුට වත් වරදක් නොකළ මිනිසුන්ය. ඉතින් එයට එරෙහි නොවන මිනිසා කවරෙක්ද ?

**චූලක බණ්ඩාරවත්ත**

## කැරවෑන් කර්මාන්තයේ දක්ෂයෙක් අවශ්‍යයි.

කැරවෑන් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාමට මනා දැනුමක් ඇති කැරවෑන් වර්ග, සැලසුම්, වැසි ඇතුළු කැරවෑන් නිපදවීමේ සියලුම දේ ගැන ඉහල පලපුරුද්දක් ඇති කෙනෙකු අවශ්‍යයි.

**කරුණාකර අමතන්න චාමර 0490104398**